# නිපුණතා තරඟාවලිය 2024 පැවැත්වීමේ ක්‍රියා පටිපාටිය

**ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගේ දක්ෂතා,හැකියාවන් හා නිපුණතා ඔප්නැන්වීම අරමුණු කරගනිමින් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය මඟින් සංවිධානය කරනු ලබන නිපුණතා තරඟාවලිය 2024.**

❖ **පසුබිම**

කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් ලබා අදාළ ක්ෂේත්‍රයන්හි නිරත වෘත්තිකයින් සඳහා ඉහළ පිළිගැනීමක්, අභිමානයක් සහ මෙකී ක්ෂේත්‍ර සඳහා තරුණ තරුණියන් දැනුවත් කිරීම සහ අවස්ථාවන් පුලුල් කිරීමේ අරමුණින් යුතුව කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණුව ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම නිපුණතා තරඟාවලිය ලෝක තරුණ නිපුණතා දිනය යෙදී ඇති 2024 ජූලි 15 දිනට අවසන් වන පරිදි පැවැත්වීමට සැලසුම් කර ඇත.

❖ **තරඟාවලියේ අංශ**

මෙම නිපුණතා තරඟාවලියේ ප්‍රධාන අංශ 02කි.

1. තෝරා ගත් ක්ෂේත්‍ර 14 ක නිපුණතාව ඇගයීමේ නිපුණතා තරඟාවලිය
2. රොබෝටික් තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ප්‍රදර්ශන තරඟාවලිය

## 01. තෝරා ගත් ක්ෂේත්‍ර 14 ක නිපුණතාව ඇගයීමේ නිපුණතා තරඟාවලිය

❖ **නිපුණතා තරඟය පිළිබඳ විස්තර**

1. තෝරා ගත් ක්ෂේත්‍ර සඳහා නිපුණතා තරඟාවලිය සංවිධානය කිරීම පිළිබඳ වගකීම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉටුකරනු ලබයි.
2. නිපුණතා තරඟය අදියර 3 ක් යටතේ පවත්වනු ලබයි.
   - මූලික තරඟය - (න්‍යායික) පළාත් මට්ටමින්
   - මූලික තරඟය - (ප්‍රයෝගික) පළාත් මට්ටමින්
   - අවසන් මහා තරඟය (කොළඹ තෝරාගත් මධ්‍යස්ථානයකදී)
3. පහත සඳහන් වෘත්තීන් සඳහා මෙම තරඟය පවත්වනු ලබයි.

   1) බේකරි ශිල්පී
   2) සූපවේදී
   3) පැස්සුම් ශිල්පී
   4) යන්ත්‍ර ශිල්පී
   5) ජලනල කාර්මික ශිල්පී
   6) දැව කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ)
   7) ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)
   8) ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පී
   9) විදුලි කාර්මික ශිල්පී
   10) පරිගණක චිත්‍රක නිර්මාණ ශිල්පී
   11) මනාලියන් හැඩගැන්වීම් ශිල්පී
   12) මෝටර් රථ කාර්මික ශිල්පී
   13) ඇඳුම් මැසීමේ ශිල්පී
   14) හෙද සාහායක

## 1.1. තරඟ කොන්දේසි

- මෙම තරඟාවලිය අදියර 03 ක් යටතේ පවත්වනු ලබයි.
- මෙම තරඟය සඳහා අයදුම් කිරීමට සුදුසුකම්.

  (NVQ) 4 මට්ටමේ පාඨමාලාවක් 2019/2020/2021/2022/2023 වර්ෂයන්හි හදාරා 2024.02.29 දිනට පෙර ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 මට්ටමේ සහතිකය ලබා ගෙන තිබීම

  හෝ

  ප්‍රතීතනය කළ පුහුණු ආයතනයක 2023 වර්ෂය තුල NVQ 4 මට්ටමේ පාඨමාලාවක පුහුණුව හදාරා අවසන් කර කර්මාන්තගත පුහුණුව අවසන් කළ හෝ දැනට කර්මාන්තගත පුහුණුවේ නිරත ආධුනිකයින්

  හෝ

  ඉහත වර්ෂයන්ට අදාලව NVQ 4 මට්ටමේ කර්මාන්තගත ආධුනිකත්ව පුහුණුව (EBT) 75% ක පුහුණු කාලයක් අවසන් කළ ආධුනිකයින්

  හෝ

  ඉහත වර්ෂයන්ට අදාලව පලපුරුද්ද අනුව (RPL) මඟින් NVQ 4 මට්ටමේ සුදුසුකම් ලැබූවන්

- වයස අවුරුදු 17ත් 35ත් වයස් කාණ්ඩය
- මූලික පළාත් තරඟ වටය සඳහා ලිඛිත පරීක්ෂණය පමණක් උපයෝගී කරගනු ලැබේ.
- ලිඛිත පරීක්ෂණ මගින් තෝරා ගන්නා ඉහලම ලකුණු ලාභීන් 03 දෙනා සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ.
- අවසන් තරඟ ප්‍රායෝගික පරීක්ෂණය පමණක් වනු ඇත.
- පළාත් සහ අවසන් තරඟ සඳහා ප්‍රශ්න පත්‍ර (ලිඛිත හා ප්‍රායෝගික) සැකසීම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන ක්ෂේත්‍රයේ නිපුණයින්ගේ සහභාගීත්වයෙන් කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ සිදුකරනු ලබයි.
- තරඟ සඳහා සහභාගී වන පළාත ලෙස සලකනු ලබන්නේ
- ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රධානය කරණ පුහුණු ආයතනයක පාඨමාලාවක් (CBT) හදාරා ඇත්නම් පුහුණු ආයතනය පිහිටි පළාත.
- කර්මාන්තගත ආධුනිකත්ව පුහුණුව (EBT) හෝ පලපුරුද්ද අනුව (RPL) නම් තම පදිංචි පළාත.
- සියලුම තරඟ සිංහල සහ දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වෙන අතර අයදුම්කරුවන් එක් මාධ්‍යයකින් පමණක් අයදුම් කළ යුතුය.
- එක් අයදුම්කරුවෙකුට අයදුම් කළ හැක්කේ එක් වෘත්තියක් පමණි.
- අපේක්ෂිත පරිසාධන මට්ටමට ළඟා නොවන තරඟකරුවන් අවසන් තරඟ සඳහා ඉදිරිපත් කරනු නොලැබේ.
- පරිසාධන මට්ටම පහත පරිදි සලකනු ලැබේ.
  - න්‍යායාත්මක(පළාත් තරගය) - 50%
  - ප්‍රායෝගික (පළාත් තරගය) - 50%
  - ප්‍රායෝගික (අවසන් තරගය) - 50%
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍ර යේ අධ්‍යාන කාර්ය මණ්ඩල සමාජිකයින්ට/ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයුම් කරුවන්ට මෙම තරගය සඳහා සහභාගි විය නොහැක.
- නියමිත පරිසාදන මට්ටමට ළඟා නොවන වෘත්තීන්හි තරග අවලංගු කරන අතර ඒ පිළිබඳ අවසන් තීරණය අතිරේක ලේකම් (වෘත්තීය පුහුණු) සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යාක්ෂ ජනරාල්වරයා සතු වේ.
- සම ලකුණු මට්ටම් ලබන සියලුම තරග කරුවන් සඳහා පාලාත් මට්ටමින් ප්‍රයෝගික තරගය සඳහා අවස්ථාව ලබා දෙනු ඇත.

- තරඟකරුවන් සඳහා නවාතැන් පහසුකම් හා ගමන් වියදම් සපයනු නොලැබේ.
- අවසන් තරඟය සඳහා ප්‍රදානය කරනු ලබන ත්‍යාග මුදල් පහත පරිදි වේ.

  01. ප්‍රථම ස්ථානය රු. 250,000.00
  02. දෙවන ස්ථානය රු. 150,000.00
  03. තෙවන ස්ථානය රු. 100,000.00

- එක් වෘත්තියක් සඳහා ප්‍රදානය කරනු ලබන ත්‍යාග මුදලේ මුළු වටිනාකම රු. 500,000.00 ක් වේ.
- මූලික පළාත් තරඟ සඳහා සහභාගී වී ඉහලම සුදුසුකම් ලබන තරඟකරුවන් තිදෙනාට කුසලතා සහතික පත්‍රයක් ප්‍රදානය කරන අතර අවසන් තරඟයෙන් ඉහලම සුදුසුකම් ලබන තරඟකරුවන් තිදෙනා සඳහා කුසලතා සහතිකයක් වෘත්තීන් අනුව ප්‍රදානය කරනු ලබයි.
- අවසන් තරඟයෙන් ජයග්‍රහණය ලබන ප්‍රථම, දෙවන හා තෙවන ස්ථානයන් ලබා ගන්නා පුහුණුලාභීන්ගේ පුහුණු උපදේශකවරයා / උපදේශකවරුන්/පුහුණුකරු(EBT) සඳහා ඇගයීමේ සහතිකයක්ද, ලබා දෙනු ලැබේ.
- මෙම තරඟවල අවසන් තීරණය අතිරේක ලේකම්(වෘත්තීය පුහුණු)/ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වේ.

## 1.2. මූලික පළාත් ලිඛිත හා ප්‍රායෝගික තරඟ පැවැත්විය යුතු ආකාරය

1 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පළාත් සහ අවසන් තරඟ පවත්වනු ලබයි.

2 අමාත්‍යාංශය මඟින් පලකරනු ලබන පුවත්පත් දැන්වීම ප්‍රකාරව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ලබා දෙන අයදුම් පත්‍රයේ (Google Form හෝ අයදුම්පත) ආකෘතියට අනුව අයදුම්පත් යොමු කළ යුතු වන අතර ඒ අනුව, ලිඛිත පරීක්ෂණයක් මඟින් ඉහත සඳහන් එක් එක් වෘත්තීන් සඳහා පළාත් මට්ටමින් තරඟකරුවන් 03 දෙනෙකු තෝරා ඔවුන් සඳහා ප්‍රායෝගික පරීක්ෂනයක් පවත්වා එක් තරග කරුවෙකු පමණක් අවසන් තරගය සඳහා තෝරාගනු ඇත. මූලික තරඟ පළාත් මට්ටමින් පැවැත්වේ.

3 (NVQ) 4 මට්ටමේ පාඨමාලාවක් 2019/2020/2021/2022/2023 වර්ෂයන්හි හදාරා 2024.02.29 දිනට පෙර ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 මට්ටමේ සහතිකය ලබා ගෙන තිබීම

හෝ

ප්‍රතීතනය කළ පුහුණු ආයතනයක 2023 වර්ෂය තුල NVQ 4 මට්ටමේ පාඨමාලාවක පුහුණුව හදාරා අවසන් කර කර්මාන්තගත පුහුණුව අවසන් කළ හෝ දැනට කර්මාන්තගත පුහුණුවේ නිරත ආධුනිකයින්

හෝ

ඉහත වර්ෂයන්ට අදාලව NVQ 4 මට්ටමේ කර්මාන්තගත ආධුනිකත්ව පුහුණුව (EBT) 75% ක පුහුණු කාලයක් අවසන් කළ ආධුනිකයින්

හෝ

ඉහත වර්ෂයන්ට අදාලව පලපුරුද්ද අනුව (RPL) මඟින් NVQ 4 මට්ටමේ සුදුසුකම් ලැබූ සිසුන්හට විවෘතව අයදුම් කළ හැක.

4 එම ඇගයුම්කරුවන් සඳහා පවත්වනු ලබන ප්‍රායෝගික ප්‍රශ්න ඇතුළත් පොදු න්‍යායික පරීක්ෂණයක් පවත්වා අදාළ ක්ෂේත්‍රයක ඉහළම ලකුණු ලබන පුහුණුලාභීන් 03 දෙනෙකු එක් වෘත්තීය ක්ෂේත්‍රයකට වන පරිදි පළාත් මට්ටමින් තෝරා ඔවුන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා ඉහල සුදුසුකම් ලබන තරග කරු අවසන් මහා තරඟය සඳහා ඉදිරිපත් කරනු ඇත.

5 ලිඛිත පරීක්ෂණයෙන් තෝරාගත් තරඟකරුවන්ගේ නාම ලේඛනය තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පලකරනු ලබන අතර සුදුසුකම්ලත් පුහුණුලාභීන් පළාත්

ප්‍රායෝගික තරඟ සඳහා යොමුකර තෝරාගන්නා ඉහලම සුදුසුකම් සහිත තරගකරුවන් අවසන් මහා තරඟයට ඉදිරිපත් කරනු ඇත.

6 ලිඛිත පරීක්ෂණය පහත සඳහන් මධ්‍යස්ථාන වලදී පමණක් පැවැත්වීමට සැලසුම් කර ඇති අතර අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව අවශ්‍ය වන්නේ නම් වෙනත් මධ්‍යස්ථානයක් තෝරාගනු ඇත.

- ✓ කොළඹ - තාක්ෂණ විද්‍යාලය, මරදාන
- ✓ ගාල්ල - තාක්ෂණ විද්‍යාලය, ගාල්ල
- ✓ බදුල්ල - තාක්ෂණ විද්‍යාලය, බදුල්ල
- ✓ නුවර - තාක්ෂණ විද්‍යාලය, නුවර
- ✓ අනුරාධපුර - තාක්ෂණ විද්‍යාලය, අනුරාධපුර
- ✓ යාපනය - තාක්ෂණ විද්‍යාලය, යාපනය
- ✓ රත්නපුර - තාක්ෂණ විද්‍යාලය, රත්නපුර
- ✓ කුරුණෑගල - තාක්ෂණ විද්‍යාලය, කුරුණෑගල
- ✓ අම්පාර - තාක්ෂණ විද්‍යාලය, අම්පාර

7. සියළුම තරඟ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අමාත්‍යාංශය මඟින් ලබා දෙනු ලබන වැය සීමාවන්ට යටත්ව තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් වියදම දරනු ලබයි.

8. මූලික පළාත් තරඟ සඳහා සහභාගී වී ඉහලම සුදුසුකම් ලබන තරඟකරුවන් තිදෙනාට කුසලතා සහතික පත්‍රයක් ප්‍රදානය කරන අතර අවසන් තරඟයෙන් ඉහලම සුදුසුකම් ලබන තරඟකරුවන් තිදෙනා සඳහා කුසලතා සහතිකයක් වෘත්තීන් අනුව ප්‍රදානය කරනු ලබයි.
9. පළාත් තරඟ පවත්වන ස්ථාන කොමිෂන් සභාව විසින් ලැබෙන අයදුම්පත් ප්‍රමාණය අනුව තීරණය කරනු ලබයි.

➢ **අවසන් තරඟය**

- එක් එක් වෘත්තීන් සඳහා පළාත් මට්ටමින් තෝරාගත් අපේක්ෂිත පරිසාධන මට්ටමට ඉක්ම වූ තරඟකරුවන් එක් ක්ෂේත්‍රයකට එක් අයෙකු වන පරිදි අවසන් මහා තරඟයට ඉදිරිපත් කරනු ලබයි.
- පළාත් තරඟ ප්‍රතිඵල අනුව එක් වෘත්තියක් සඳහා උපරිම ලෙස තරඟකරුවන් 09 දෙනෙකු සහභාගී විය හැකිය.
- අවසන් තරඟය සඳහා ඉදිරිපත් කරනු ලබන තරඟකරුවන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණ පමණක් පවත්වනු ලබයි.
- අවසන් තරඟ සඳහා සහභාගී වන සියලුම තරඟකරුවන් සඳහා කුසලතා සහතික පත්‍රයක් ප්‍රදානය කරන අතර, අවසන් තරඟයෙන් ජයග්‍රාහී තරඟකරුවන් සඳහා කුසලතා සහතිකයක්, සමරු කුසලානයක් සමඟ මුදල් ත්‍යාග ප්‍රදානය කරනු ලබයි.

✶ **තරඟ විනිශ්වය**

- අදාල වෘත්තීන්හි තරඟ විනිශ්වය සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ඇගයීම්කරුවන් දෙදෙනෙකු සහ කර්මාන්තයේ ප්‍රවීණයෙකු පත්කරනු ලැබේ.

විනිශ්වය මණ්ඩලයේ සාමුහික තීරණයේ නිර්දේශය මත අවසන් තීරණය අතිරේක ලේකම් (වෘත්තීය පුහුණු ) / තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් මඟින් ගනු ලබයි.